# 2023.03.02 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු රැස්වීම් වාර්තාව.

2023 ක් වූ මාර්තු මස 02 වන දින පෙ.ව 10.00 ට පමණ ගරු සභාපති ආනන්ද වීරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් කඹුරුපිටිය ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව.

**පැමිණීම**

01. ගරු ප්‍රාදේශීය සභා සභාපති - ආනන්ද වීරසිංහ මහතා

02. ගරු ප්‍රාදේශීය සභා උප සභාපති - දුමින්ද පුෂ්පකුමාර මහතා

03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ප්‍රේමවංශ වර්ණකුල මහතා

04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - රුචිර යකල්ලේආරච්චි මහතා

ලේකම් - නාලිකා අබේකෝන් මිය

**නොපැමිණීම.**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මනෝරි සමරවික්‍රම මිය

02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - රෙජී වෙල්ලප්පිලි මහතා

03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - නලින් නරසිංහ මහතා

ගරු ප්‍රාදේශීය සභා සභාපති ආනන්ද වීරසිංහ මහතා විසින් අද දින නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු රැස්වීමට පැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා සහ නිලධාරීන් ගෞරවයෙන් පිළිගන්නා ලදි. ඉන්පසුව පසුගිය කමිටුවේ නිර්දේශ කරන ලද කරුණු පිළිබඳව ප්‍රගතිය සාකච්ඡා කරන ලදි.

01. කරගොඩ උයන්ගොඩ වැඩිහිටි සමිතිය විසින් කද්දුව මහජන පුස්තකාල ගොඩනැගිල්ලේ පහල මාලය සමිතියේ මාසික රැස්වීම් පැවැත්වීම සඳහා අවසර ලබා ගැනීමේ ලිපිය කමිටුව විසින් සලකා බලන ලදි.

02. කඹුරුපිටිය ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කේ.පී.සමන් ප්‍රියන්ත මහතා විසින් ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ඉඩ කඩ ප්‍රමාණවත් නොවන බැවින් ඊට යාබදව

ඇති පාවිච්චියට නොගන්නා කාමර අලුත්වැඩියා කර ලබා දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය කමිටුව විසින් සලකා බලන ලදි.

එම දැනට භාවිතයට නොගන්නා කොටස ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට ලබා දීම සුදුසු බවත් එම වෛද්‍ය නිලධාරීන්ට එම කොටස සකස් කර ගැනීම සඳහා අනුමැතිය ලබා දීමටත් එසේ සකස් කර ගත නොහැකි නම් ප්‍රාදේශීය සභාව විසින් සකස් කර ලබා දීම සුදුසු බව කමිටුව ඒකමතිකව නිර්දේශ කරන ලදි.

03. ආයුර්වේද බෙහෙත්ශාලාවෙන් බෙහෙත් ලබා ගැනීමට පැමිණෙන රෝගීන් උදෑසන ආයුර්වේද බෙහෙත්ශාලාව සොයා ගත නොහැකිව ප්‍රාදේශීය සභාව වෙත පැමිණීම නිසා රෝගීන් විවිධ අපහසුතාවයන්ට පත් වේ. එබැවින් ප්‍රාදේශීය සභාව ඉදිරිපිට ප්‍රාදේශීය සභා නාමපුවරුව සවිකර ඇති ස්ථානය අසල නිදහස් ආයුර්වේද බෙහෙත්ශාලාව සහ දිවාසුරැකුම් මධ්‍යස්ථානය ඊතලයකින් පෙන්නුම් කර ප්‍රදර්ශනය කර

නාමපුවරුවක් සවි කිරීම සුදුසු බවත් ඒ සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථානය මුල් ගල තැබීමේ නාම පුවරුව ගලවා ඉවත් කර පැරණි ප්‍රාදේශීය සභා ගබඩාවේ ඇති අතර එම නාමපුවරුව ඒ සඳහා භාවිතා කිරීමට කටයුතු කරන ලෙස කමිටුව ඒකමතිකව නිර්දේශ කරන ලදි.

04. දැනට ආයුර්වේද බෙහෙත් ශාලාවේ සායනවලට බාධාවක් නොවන පරිදි කඹුරුපිටිය ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට පහසු දිනයන් වෙන් කර ගෙන කොට්ඨාශ මට්ටමින් ජංගම ආයුර්වේද සායන (බෙහෙත් ලබා දීම සහිතව) සිදු කිරීම සුදුසු බව කමිටුව ඒකමතිකව නිර්දේශ කරන ලදි.

අද දිනට නියමිත වැඩ කටයුතු අවසන් බැවින් පැමිණි සියලු දෙනාට ගරු සභාපතිතුමා විසින් ස්තුති කරමින් නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

ආනන්ද වීරසිංහ,
කමිටු සභාපති,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.